සැ.යු. - 2024.12.27 වැනි දින පළකරන ලද අංක 2417 ගැසට් පත්‍රයේ IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,418 - 2025 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2025.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## III කොටස : ඉඩම්

(වෙන වෙන ම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක්

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීම පිළිබඳ දැන්වීම් : | |
| ප්‍රාරම්භක දැන්වීම් ... ... ... ... | — |
| අවසාන නියෝග ... ... ... ... | — |
| ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභා දැන්වීම් ... ... | — |
| ආණ්ඩුවේ ඒජන්තවරු විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත ... ... ... ... | — |
| මධ්‍යම පළාත ... ... ... ... | — |
| දකුණු පළාත ... ... ... ... | — |
| උතුරු පළාත ... ... ... ... | — |
| නැගෙනහිර පළාත ... ... ... ... | — |
| වයඹ පළාත ... ... ... ... | — |
| උතුරු මැද පළාත ... ... ... ... | — |
| ඌව පළාත ... ... ... ... | — |
| සබරගමුව පළාත ... ... ... ... | — |

| | පිටුව |
|---|---|
| ඉඩම් නිරවුල් කිරීමේ නිලධාරි විසින් ඉඩම් විකිණීම : | |
| බස්නාහිර පළාත .... ... ... ... | — |
| මධ්‍යම පළාත .... ... ... ... | — |
| දකුණු පළාත .... ... ... ... | — |
| උතුරු පළාත .... ... ... ... | — |
| නැගෙනහිර පළාත .... ... ... ... | — |
| වයඹ පළාත .... ... ... ... | — |
| උතුරු මැද පළාත .... ... ... ... | — |
| ඌව පළාත .... ... ... ... | — |
| සබරගමුව පළාත .... ... ... ... | — |
| ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම් .... ... ... | — |
| ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම් .... ... | 02 |
| ඉඩම් නිදහස් කිරීම පිළිබඳ දැන්වීම් .... ... | — |
| ඉඩම් හිමි ගැමි ක්‍රමය යටතේ ඉඩම් දීම.... ... — | — |
| ඉඩම් පිළිබඳ විවිධ දැන්වීම් .... ... | — |

### සතිපතා නිකුත් වන *ගැසට්* පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන්, ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලි ව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2025 ජනවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2025 ජනවාරි මස 10 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක් නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය, හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

01 - B 82642—553 (2025/01)
C1-

# ඉඩම් සංවර්ධන ආඥාපනත යටතේ දැන්වීම්

## ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 වන වගන්තියේ (4) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රදාන පත්‍රය අවලංගු කිරීම - (104 වගන්තිය) සඳහා වූ නිවේදනය

නැගෙනහිර පළාත් සභාවේ, මඩකලපුව දිස්ත්‍රික්කයේ, කෝරළේ පත්තු දකුණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ප්‍රාදේශීය ලේකම් කාසි පිල්ලෙයි සිත්තරවෙල් වන මම, ඉඩම් සංවර්ධන ආඥාපනතේ 19 (4) උප වගන්තිය යටතේ අතිගරු ජනාධිපති විසින් 1996.06.20 දින ප්‍රදානය කර ඇති අංක මඩ/ප්‍රා/කෙ. පි. 2334 දරන ප්‍රදාන පත්‍රයේ හිමිකරු වන රාමලිංගම් ආරුමුහම් පාලයඩිතෝනා පදිංචි වෙත ප්‍රදානය කොට මඩකලපුව දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ අංක KP/05/22/108 යටතේ 1998.04.16 දින ලියාපදිංචි කරනු ලැබ ඇති පහත උපලේඛනයේ දැක්වෙන ඉඩමට අනුප්‍රාප්තිකයෙකු වීම සඳහා නීත්‍යානුකූලව හිමි අයෙකු නොමැති වීමෙන් හෝ හිමිකම් ඇති අයෙකු සිටිය ද ඔහු/ඇය අනුප්‍රාප්තිකයකු වීමට අකමැති වීමෙන් අනුප්‍රාප්තිකභාවයට කෙනෙකු පත්වීමට නැතැයි වාර්තා වී ඇති බැවින් එකී දීමනා පත්‍රය උක්ත පනතේ 104 වන වගන්තිය යටතේ අවලංගු කිරීමට ක්‍රියා කරගෙන යන බැව් මෙයින් දැනුම් දෙමි. මේ පිළිබඳව යම් විරෝධතාවයක් ඇත්නම් එය 2025.02.21 දිනට පෙර මා වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

## උපලේඛනය

මඩකලපුව පරිපාලන දිස්ත්‍රික්කයේ, කෝරළේ පත්තු දකුණු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පාලයඩිතෝනා ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, පාලයඩිතෝනා නමැති ගමේ පිහිටා ඇත්තා වූ ද, රාමලිංගම් ආරුමුහම් භාරයේ ඇති සහ සර්වේයර් ජනරාල්වරයා විසින් සම්පාදිත අංක පිපිමඩ 1115 දරන ක්ෂේත්‍ර පත්‍රයෙහි කේ. කේ. වින් අයියා විසින් සම්පාදිත අංක 45/6/2 (G25/58) දරන කට්ටි කැඩීමේ පිඹුරේ ප්‍රමාණයෙන් අක්කර 0.1245 ක් විශාලත්වය ඇත්තා වූ ද, පහත දැක්වෙන පරිදි මායිම වූ ද රජයේ ඉඩම:

| | | |
|---|---|---|
| *උතුරට* | - | කොටස් - 40, |
| *නැගෙනහිරට* | - | කොටස් 33, 32, |
| *දකුණට* | - | කොටස් 51, |
| *බස්නාහිරට* | - | කොටස් 29, 30. |

කා. සිත්තරවෙල්,
ප්‍රාදේශීය ලේකම්,
කෝරළේ පත්තු දකුණ,
කිරාන්.

2024 අප්‍රේල් මස 10 වැනි දින.

01-21

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදනය භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපැලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතු ය.**

**සැළකිය යුතුයි. -** මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

**2025 වර්ෂය**

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජනවාරි** | 2025.01.03 | සිකුරාදා | 2024.12.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.10 | සිකුරාදා | 2024.12.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.17 | සිකුරාදා | 2025.01.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.24 | සිකුරාදා | 2025.01.10 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.01.31 | සිකුරාදා | 2025.01.17 | සිකුරාදා | දහවල් | 12.00 |
| **පෙබරවාරි** | 2025.02.07 | සිකුරාදා | 2025.01.24 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.14 | සිකුරාදා | 2025.01.31 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.21 | සිකුරාදා | 2025.02.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.02.28 | සිකුරාදා | 2025.02.14 | සිකුරාදා | දහවල් | 12.00 |
| **මාර්තු** | 2025.03.07 | සිකුරාදා | 2025.02.21 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.14 | සිකුරාදා | 2025.02.28 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.21 | සිකුරාදා | 2025.03.07 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2025.03.28 | සිකුරාදා | 2025.03.14 | සිකුරාදා | දහවල් | 12.00 |

**කේ. ජී. ප්‍රදීප් පුෂ්ප කුමාර,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2025 ජනවාරි මස 02 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.